# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

# නම් සංශෝධනය කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව, දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ලියාපදිංචි වී පරීක්ෂණ සඳහා පෙනීසිටින අපේක්ෂකයින් තම නම්වල යම් සංශෝධනයක් සිදු කිරීමට අපේක්ෂා කරන්නේ නම් හෝ දැනට ලියාපදිංචි වී ඇති නමෙහි යම් වෙනස් කිරීමක් සිදුකිරීමට ඇත්නම් එම සියලුම සංශෝධනයන් තමන් පෙනී සිටීමට නියමිත අවසන් පරීක්ෂණයට පෙර සිදුකිරීම අනිවාර්යය වේ.

අවසන් පරීක්ෂණය සඳහා පෙනීසිට ඇති නමින් පමණක් මුල් උපාධි සහතිකය නිකුත් කරන බැවින් ඉන් පසුව නම්වල සංශෝධනයන් සඳහා කරනු ලබන ඉල්ලීම් පිළිබඳ සලකා බැලීමේ හැකියාවක් නොමැත. එහෙයින් තම නමෙහි යම් සංශෝධනයක් සිදුකිරීමට ඇත්නම් අදාළ ලේඛන ද සමග 2023 ජුලි 05 දිනට පෙර **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, තැ.පෙ. 03, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස දන්වමි.

තවද 2023 ජුනි 05 හා 15 යන දිනවල නිකුත්කරන ලද උපාධිලාභීන්ගේ නාම ලේඛනයෙහි නම් සඳහන් උපාධිලාභීන් හට තම නමෙහි **අකුරුවල සංශෝධනයන් සිදු කිරීමට ඇත්නම්** විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට ඉදිරිපත් කිරීම සඳහා ඒ බව සඳහන් කරන ලද අභියාචනාවක් ජුලි මස 05 දිනට පෙර දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත ගෙනවිත් බාර දෙන ලෙස වැඩිදුරටත් දන්වමි.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
කැලණිය විශ්වවිද්‍යාලය
2023.06.27